Statement of Financial Position

SLR

As at 31st December 2014	Note	2014	2013 (Re stated)
ASSETS			
Current Assets			
Cash & Cash Equivalents	1	108,953,351	63,462,411
Receivables	2	91,194,457	111,806,151
Inventories		2,186,930	2,079,049
Pre Payments/Deposits	3	11,215,173	7,863,478
Total current assets		**213,549,911**	**185,211,089**
Non Current Assets			
Infrastructure, Plant & Equipments	4	46,631,206	38,272,737
Land & Building	4	507,661,116	490,869,570
Work in progress		696,639	-
Investments	5	74,231,445	13,050,983
Bond Premium		9,791,350	-
Endowment /Scholarship fund Investments	6	17,639,005	17,438,969
Total non-current assets		**656,650,761**	**559,632,259**
Total assets		**870,200,672**	**744,843,348**
EQUITY AND LIABILITIES			
Current Liabilities			
Payables	7	139,969,456	127,673,874
Payments received in advance/Deposits	8	4,758,858	322,383
Total current liabilities		**144,728,314**	**127,996,257**
Non- Current Liabilities			
Retirement Benefit Obligation	9	37,969,455	36,798,930
Endowment Fund	10	22,042,557	19,230,185
Research Funds	11	12,943,750	12,150,870
Specific Funds	12	21,125,002	10,278,787
Total non-current liabilities		**94,080,764**	**78,458,772**
Total liabilities		**238,809,078**	**206,455,029**
NET ASSETS		**631,391,595**	**538,388,319**
CONSOLIDATED FUND & RESERVES			
Deffered capital grants	13	47,783,410	14,098,905
Capital grants-Unspent	14	17,161,468	2,091,164
Rehabilitaion & Imp.grants-Unspent	15	2,870,264	2,097,125
Human Capital development fund-unspent	16	9,666,410	16,190,934
Staff Development Fund		43,265,908	17,000,000
UGC development fund		20,000,000	
Revaluation Surplus		509,313,767	509,313,767
Accumulated Surpluses/ (Deficits)		(18,669,630)	(22,403,575)
TOTAL NET ASSETS/ EQUITY		**631,391,595**	**538,388,319**

Prof. Mohan De Silva
Chairman

R.A.U Ranaweera
Accountant

Statement of Financial Performance

SLR

For the Year Ended 31st December 2014	Note	2014	2013 (Restated)
REVENUE			
Government Grants	17	1,344,181,807	1,146,754,570
Other Revenue	18	46,462,951	41,572,327
		-	-
Total Revenue		**1,390,644,758**	**1,188,326,897**
EXPENSES			
Wages, Salaries & Employee Benefits	19	131,962,520	115,982,138
Supplies & Consumables Used	20	49,533,038	52,260,038
Grants & other Transfer Payments	21	1,072,091,190	898,471,931
Depreciation & Amortization Expenses	22	18,428,890	21,295,633
Rehabilitation Expenses	23	12,918,680	19,528,951
Other Expenses	24	61,976,495	65,591,559
Total Expenses		**1,346,910,813**	**1,173,130,250**
Surplus/(defecit) for the period		**43,733,945**	**15,196,647**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසි/බී/යූජීසී/1/14/7 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2015 ජූලි 28 දින

සභාපති,

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(5) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය, 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2015 ජූනි 17 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>මතය</u>

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.